# මුද්දර ගාස්තු
# Stamp Duty

## AAT අදියර III
## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# මුද්දර ගාස්තු
# (Stamp Duty)

පරිච්ඡේදය 8

## හඳුන්වාදීම (Introduction)

1982 අංක 43 පනතින් සමහර ලියවිලි මත මුද්දර බද්ද පනවන ලදී. 2002 දී මධ්‍යම ආණ්ඩුව විසින් පාලනය කරන ලද මුද්දර ගාස්තු අත්හිටුවන 2006 අප්‍රේල් 01 දින සිට බලපවත්වන පරිදි 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත පනවන ලදී.

කෙසේ වෙතත් නිශ්චල දේපල සහ මෝටර් වාහන පැවරීම මත පළාත් සභා විසින් අය කරන මුද්දර ගාස්තු නොකඩවා ක්‍රියාත්මක විණි.

## බද්දට යටත් වීම (3 වගන්තිය)

2006 අංක 12 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත අනුව සෑම ''විශේෂිත සාධන පත්‍රයක්'' (Specified Instrument) මතම මුද්දර ගාස්තු අය කරනු ඇත. එම සාධන පත්‍රය,

(අ) ශ්‍රී ලංකාවේදී ලියා අත්සන් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටතදී ලියා අත්සන් කරන ලද්දක් වුවත් එය ඉදිරිපත් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති දේපලක් සම්බන්ධයෙන් වූ සාධන පත්‍රයක් විය යුතුය.

පනතේ 04 වන වගන්තිය අනුව ''විශේෂ සාධන පත්‍රයක්'' යන්නෙන් පහත දෑ අදහස් කෙරේ.

(a) දිවුරුම් පෙත්සමක්
(b) රක්‍ෂණ ඔප්පුවක්
(c) ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස ක්‍රියාකිරීමේ අධිකාරී පත්‍රයක්
(d) වෙළඳාම, ව්‍යාපාර, වෘත්තීය කරගෙන යාමට කාලානුරූපීව බලපත්‍රයක් ලබා ගැනීම
(e) යම් මුදලකට හෝ වෙනත් දේපලක් සඳහා දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක්
(f) ණයපත් හිමියන් විසින් කරන ලද හිමිකම් ඉල්ලීම
(g) කොටස් සහතිකයක්
(h) පොරොන්දු නෝට්ටුවක්
(i) ඕනෑම දේපලක උකසක්

JMC vLearning your virtual learning partner

## ගෙවිය යුත්තේ කවුරුන් විසින් ද? (6 වැනි වගන්තිය)

මුද්දර ගාස්තුව ගෙවිය යුතු වනුයේ පහත තැනැත්තන් විසිනි.

(a) රක්‍ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන්, එම රක්‍ෂණ ඔප්පුව බලපාන්නා වූ තැනැත්තා විසින්,

(b) බදු දීමක් සම්බන්ධයෙන් වන විට බදු ගැණුම්කරු විසින්

(c) නොතාරිස්වරයෙකු වශයෙන් ක්‍රියා කිරීමට අධිකාරී පත්‍රයක් සම්බන්ධයෙන් අදාළ නොතාරිස් තනතුර අයදුම් කරන්නා විසින්,

(d) සේවාදායකයාගෙන් හිමිකම් ඉල්ලීමකදී ණය කාඩ්පත්හිමියා විසින්,

(e) වෙනත් සියලු අවස්ථාවලදී, එකී සාධන පත්‍රය සකස් කරන තැනැත්තා විසින්,

(f) හිමිකමක් ඉල්ලීමේදී, සේවාදායකයා විසින් ණය කාඩ්පත් හිමියාගෙන් කරන ඉල්ලීමකදී

## මුද්දර ගාස්තු නිදහස් කිරීම් (Exemption for Stamp Duty)

1. ඕනෑම ජීවිත හෝ වෛද්‍ය රක්‍ෂණ ඔප්පුවක්

2. (a) සිවිල් ඉදිකිරීම හෝ කෘෂිකාර්මික කර්මාන්තයන්හි භාවිතා කරන පිරියත, යන්ත්‍ර හෝ උපකරණ හෝ

   (b) B පන්තියේ ද්විත්ව කාර්යය මෝටර් වාහනයක් හෝ කාර් රථයක් හැර වෙනත් ඕනෑම මෝටර් වාහනයක් සඳහා වන රක්‍ෂණ ඔප්පුවක්

3. මාසයකට රු. 5,000 ක් නොඉක්මන කුලී, ගෙවීමක් ඇති ගොඩනැගිල්ලක් සඳහා වන කල් බද්දක් හෝ කුලියක් සම්බන්ධ යම් සාධන පත්‍රයක්

4. වාණිජ පත්‍රයක් හෝ ණයකරයක්

5. විශ්‍රාම වැටුපක් ලැබුණු බවට දෙනු ලබන ලදුපතක්

6. යම් සමාගමක ඕනෑම කොටස් ගණනක් නිකුත් කිරීම, මාරු කිරීම හෝ වෙන් කිරීම සඳහා නිකුත් කරන කොටස් සහතිකයක්

7. (a) නිවසක් ඉදිකිරීම සඳහා හෝ

   (b) නිවසක් හෝ නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම සඳහා

8. බලපත්‍රලාභී හෝ විශේෂිත බැංකුවක් හෝ මූල්‍ය සමාගමක් හෝ දේශීය ආදායම් කොමසාරිස් අනුමත කල අර්ථසාධක අරමුදලකින් හෝ උකස්කරු වන රු. මිලියන 03 ක් හෝ ඊට අඩු ණයක් සඳහා සකස් කරනු ලබන උකස් ඔප්පුවක්.

මුද්දර ගාස්තු ගෙවීම්

- මධ්‍යම රජයට ගෙවිය යුතු මුද්දර ගාස්තු
- පළාත් සභාවට ගෙවිය යුතු මුද්දර බදු

## මධ්‍යම රජයට ගෙවිය යුතු මුද්දර ගාස්තු

| | සාධන පත්‍රය | අනු ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1. | දිවුරුම් ප්‍රකාශයක් | 50.00 |
| 2. | රක්ෂණ ඔප්පුවක් - ඒ මත ගෙවිය යුතු මුලු රක්ෂණ වාරිකවල එකතුවේ සෑම රු. 1,000 කටම හෝ කොටසකට | 1.00 |
| 3. | ක්‍රෙඩිට් කාඩ් ගණුදෙනුවක් - සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට | 25.00 |
| 4. | පොරොන්දු නෝට්ටුවක් - සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට | 1.00 |
| 5. | කිසියම් දේපලක් කුලියට දීමේ සාධන පත්‍ර<br>- කුලී සින්නක්කර ගිවිසුමක් නොවන - කුලී හෝ බදු ගිවිසුමක වාර්ෂික වාරිකයක් ද ඇතුලුව ගෙවිය යුතු සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට<br>- 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනත යටතේ එළඹුණු කුලී සින්නක්කර ගිවිසුමක් මත ගෙවිය යුතු බදු වටිනාකමේ සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට | 10.00<br><br>10.00 |
| 6. | කිසියම් මුදලක් හෝ දේපලක් වෙනුවෙන් වන ලදු පතක් හෝ නිදහස් කිරීමක්<br>• රු. 25,000 දක්වා (25,000 ඇතුලත්ව)<br>• රු. 25,000 ට වැඩි | <br>නිදහස්<br>25.00 |

JMC vLearning "your virtual learning partner"

<u>ප්‍රශ්නය 01</u>

ABC පුද්ගලික සමාගම සේවකයින් 15 දෙනෙකුගෙන් සමන්විතයි. ඉන් 12 දෙනෙකුහට රු. 25,000/- ඉක්මවන ශුද්ධ වැටුපක් ඇත. අනිත් 3 දෙනාගේ ශුද්ධ වැටුප රු. 25,000 ට අඩුය.

සමාගම විසින් මධ්‍යම රජයට ප්‍රේෂණය කල යුතු මුද්දර බදු ප්‍රමාණය කොපමණද?

## පළාත් සභාවලට ගෙවිය යුතු මුද්දර බදු

පහත සඳහන් සාධන පත්‍ර මත මුද්දර බදු පළාත් සභාවලට ගෙවිය යුතුය.

(a) නිශ්චල දේපල පැවරුම් සම්බන්ධයෙන් මත සාධන පත්‍ර (ඔප්පු) මත (ඒ ඒ පළාත් සභාවට අයත් පරිදි)

(b) පළාත් සභාව තුල පනවනු ලබන නීතියක් යටතේ අධිකරණ කාර්යය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන මත

(c) අදාළ පළාත් සභාව තුල සිදු කෙරෙන මෝටර් වාහනවල අයිතිය මාරුකිරීම් මත

**ඉහත (a) යටතේ පැනවෙන මුද්දර ගාස්තු**

| | රු. |
|---|---|
| (1) <u>නිශ්චල දේපල තෑගි කිරීමකදී</u> | |
| (අ) දේපලේ අගය රු. 50,000 හෝ ඊට අඩුනම් එම අගයේ සෑම රු. 100 කටම හෝ ඉන් කොටසකට | 3.00 |
| (ආ) දේපලේ අගය රු. 50,000 ට වැඩි නම්,<br>(a) රු. 50,000 නොඉක්මවන අගයේ සෑම රු. 100 කටම<br>(b) රු. 50,000 ඉක්මවන අගයේ සෑම රු. 100 කටම | <br>3.00<br>2.00 |
| (2) <u>තෑගි කිරීමක් නොවන නිශ්චල දේපල මාරු කිරීමකදී</u> | |
| (අ) දේපලේ අගය රු. 100,000 හෝ ඊට අඩුනම් එම අගයේ සෑම රු. 100 කටම හෝ ඉන් කොටසකට | 3.00 |
| (ආ) දේපලේ අගය රු. 100,000 ට වැඩි නම්,<br>(a) රු. 100,000 නොඉක්මවන අගයේ සෑම රු. 100 කටම<br>(b) රු. 100,000 ඉක්මවන අගයේ සෑම රු. 100 කටම හෝ කොටසකට | <br>3.00<br>4.00 |

JMC vLearning "your virtual learning partner"

<u>ප්‍රශ්නය 02</u>

පෙරේරා මහතා බස්නාහිර පළාත තුල පිහිටි ඉඩමක් රු. 3,000,000 කට විකුණා ඇත. බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු මුද්දර ගණනය කරන්න.

## මුද්දර ගාස්තු ගෙවීම (8 වගන්තිය)

මුද්දර ගාස්තු පහත ඕනෑම ආකාරයකට පියවිය හැකිය. (2008 අංක 10 දරණ සංශෝධිත පනත)

(a) මුද්දර ඇලවීම මගින්.

(b) කෙලින් බැංකුවට ගෙවා දේශීය ආදායම් කොමසාරිස් විසින් සහතික කරන ලද සහතිකයක් ලබා ගැනීම.

(c) මුද්දර ගාස්තු සමුච්චය කර සමථයට පත් කිරීම.

## මුද්දර ගාස්තු සමුච්චය කර සමථයට පත් කිරීම (7 වගන්තිය)

දේශීය ආදායම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය සහ ලියාපදිංචි ලබා ගැනීමෙන් අනතුරුව එම මුද්දර ගාස්තු සමුච්චය කර කාර්තුව අනතුරුව එම මුද්දර ගාස්තු සමුච්චය කර කාර්තුව අවසානයේ සිට දින 15 ක් ඇතුලත සමථයකට පත් කිරීමට පහත තැනැත්තෙකුට පුළුවන් වේ.

(a) රක්‍ෂණ ඔප්පු නිකුත් කරනු ලබන යම් තැනැත්තෙකු විසින්,

(b) බලපත්‍ර නිකුත් කරන යම් අධිකාරියක් විසින්,

(c) සේවකයන් 100 කට වැඩියෙන් සේවයේ යොදවන සේවායෝජකයෙකු විසින්,

(d) නියම කර ඇති ආකාරයකට හෝ අවස්ථාවට අනුව යම් ප්‍රභේදයක් සාධන පත්‍ර ලෙස මුද්දර යෙදීම ප්‍රායෝගික නොවන හෝ කාර්යයක් වීම නොවන ලෙස සැලකිල්ලට ගැනීමේදී යම් වෙනත් ආකාරයේ සාධන පත්‍ර නිකුත් කරන වෙනත් තැනැත්තෙකු විසින්,

(e) ණයපත් සපයන සේවාදායකයෙක්.

JMC vLearning "your virtual learning partner"

**සැකසුම: නුවන් සමීර**